| අ.පො.ස. සාමාන්‍ය පෙළ |
|---|
| නර්තනය |
| කාර්ය පත්‍රිකා - අංක 01 |

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. මණ්ඩියට සිටීමේ දී දෙපා අතර පරතරය විය යුත්තේ ............................................................ කි.

02. දේශීය නර්තන සම්ප්‍රදායන් හි බෙර වාදනයෙන් තොරව තාලම්පට වාදනය කරමින් නටනු ලබන්නේ .......................................................................................................... වේ.

03. නර්තනය හදාරන ආධුනික ශිල්පියෙකු මුලින්ම හදාරන සරඹ විශේෂය වන්නේ .............................. ය.

04. "තෙයිත තෙයිත තෙයි තෙයියත් තාම්" යන පා සරඹ පදය .......................................... සහ .......................................... යන පා සරඹවලදී භාවිතා වේ.

05. අටවන පා සරඹය හඳුන්වන්නේ .......................................... නමින් ය.

06. පා සරඹ හමාර කරනු ලබන්නේ .......................................... පදයෙනි.

07. අතීතයේ පා සරඹ නර්තනය සඳහා .......................................... භාවිතා කර ඇත.

08. පා සරඹ .......................................... යනුවෙන් ද හඳුන්වයි.

09. සබරගමු නර්තනයේදී පා සරඹ හඳුන්වන්නේ .......................................... යනුවෙනි.

10. පහතරට සම්ප්‍රදායේ දී පාද හුරුකරගන්නා සරඹ .......................................... ලෙස හඳුන්වයි.

11. සෑම ගොඩ සරඹයක්ම අවසන් කරනු ලබන්නේ .......................................... නැටීමෙනි.

12. උඩරට සම්ප්‍රදායේ දී ගොඩ සරඹ නමින් හඳුන්වන සරඹ පහතරට සම්ප්‍රදායේ දී ..................................

සරඹ යනුවෙන් ද සබරගමු සම්ප්‍රදායේ දී .................................. සරඹ යනුවෙන් ද හඳුන්වයි.

13. උඩරට සම්ප්‍රදායේ දී සුරල් පෑගීම සිදු කරනු ලබන්නේ .......................... වෙනි පා සරඹයේ දී ය.

14. "දෑත පෑගීම් සරඹය" යනුවෙන් හඳුන්වන්නේ .................................. ගොඩ සරඹයයි.

15. "රුංතක ජිංතක තරිකිට කුංදත් " කස්තිරම් ආරම්භ වන්නේ .............................. ගොඩ සරඹයේ දී ය.

16. ............................ ගොඩ සරඹයේ සිට සුරල් පෑගීමේ කස්තිරම් ආරම්භ කරයි.

17. සතර බීජාක්ෂර මුදුන් කරමින් කරනු ලබන කස්තිරම් නාමික වශයෙන් ............................ සරඹය හා ............................ සරඹයේ දී නටනු ලබයි.

18. සරඹ අභ්‍යාස කිරීමේ දී ............................ , ............................ හා ............................ යන ත්‍රිවිධ ලය අනුගමනය කරයි.

19. සරඹ අභ්‍යාස කිරීමේ දී නර්තනයේ නිවැරදි ............................ ලක්ෂණ ප්‍රදර්ශනය විය යුතු ය.

20. උඩරට නර්තන සම්ප්‍රදායට වන්නම් .................... ක් ද පහතරට නර්තන සම්ප්‍රදායට වන්නම් .................... ක් ද සබරගමු සම්ප්‍රදායට වන්නම් .................... ක් ද ඇතුළත් ය.

21. කවි ගායනයේ දී හස්ත චලන පමණක් දක්නට ලැබෙන නර්තන සම්ප්‍රදායක් වන්නේ .........................

සම්ප්‍රදාය වේ.

22. පහතරට නරතනයේ දී වන්නම් හඳුන්වන්නේ .......................................... යනුවෙනි.

23. ......................... නර්තන සම්ප්‍රදායේ එන වන්නම්වලින් දේව භක්තිය ඉස්මතු කර දක්වයි.

24. උඩරට සම්ප්‍රදායේ තාල රූප දෙකකට ගායනා කරන වන්නම වන්නේ .............................. වන්නම ය.

25. සැවුලා වන්නම නටනු ලබන්නේ මාත්‍රා ............................... තාල රූපය අනුව ය.

26. සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණය පිළිබඳව ............................... වන්නම තුළින් කියවේ.

27. "ගත්ත තෙහිගු තකට තකුඳ" යනුවෙන් සඳහන් අඩව්ව නර්තනය කරනුයේ ............................... වන්නමේ දී ය.

28. ......................................................... යන පද කොටසින් ආරම්භ වන්නේ සිංහරාජ වන්නමේ කස්තිරමය.

29. හනුමා වන්නමේ තාල රූපය වන්නේ ............................... තිත වන අතර එහි බෙර පදය වන්නේ .................................................. ය.

30. උඩරට වන්නමක කොටස් .............................. ක් ඇතුළත් වේ.

31. නර්තන කලා ඉතිහාසය පිළිබඳ තොරතුරු ලබාගත හැකි වංශ කතා මූලාශ්‍ර වන්නේ ............................... හා ............................... වේ.

32. අතීත නර්තන කලාව පිළිබඳ තොරතුරු හමුවන සෙල්ලිපි 03ක් වන්නේ ......................................... , ......................................... හා ......................................... ය.

33. දෙව් මිනිස් නැටුම් පැවැත්වූයේ ......................................... රජු ඉදිරියේ ය.

34. දුටුගැමුණු රජු නළඟනන් දහසය දහසක් පිරිවරා රුවන්වැලි සෑය බඳින උත්සවයට ගිය බව සඳහන් වන්නේ ......................................... ය.

35. ලෝකඩ නළඟන රූපයක් අනුරාධපුරයේ ......................................... හමුවී ඇත. ඉන් නිරූපණය වන්නේ ........................................... අවස්ථාවකි.

36. මහා පරාක්‍රමබාහු රජු විසින් නැටුම් ගැයුම් වැයුම් සඳහා ......................................... ඉදිකළ බව චූලවංශයේ සඳහන් ය.

37. වෙස් බැඳි නැට්ටුවෙකුගේ ලී කැටයමක් හමුවන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ................................. ය.

38. දෙවුන්දර දේවාලයේ හින්දු බාලිකාවන් ගී ගයා නැටූ බව සඳහන් කරන 14වන සියවසේ මෙරටට පැමිණි දේශ ගවේෂකයා ............................... ය. ඒ පිළිබඳ සඳහන් වන ග්‍රන්ථය වන්නේ .......................................................

39. මහනුවර රාජ්‍යසමයේ ලක්දිව නර්තන කලාව පිළිබඳ තොරතුරු සඳහන් කළ විදේශිකයන් දෙදෙනා වන්නේ ........................................... හා ........................................... ය.

40. මහනුවර පෙරහරහැරේ නැටුම් පිළිබඳ තොරතුරු දක්වා ඇති විදේශ වාරතාකරු වූයේ ............................................ ය.

41. පොලොන්නරු යුගයේ දී සෙබළුන්ගේ ආස්වාදය පිණිස නැටුම්, ගැයුම්, වැයුම් පැවැත්වූ බව ............................................ සඳහන් ය.

42. සිවුරැස් ජනේලයක නිලියක මණ්ඩියට සිටින ආකාරය දැක්වෙන ලී කැටයමක් දක්නට ඇත්තේ ............................................ ය.

43. අතීත නර්තන කලාව හා සම්බන්ධ ලෝකඩ නටරාජා පිළිමය හමුවී ඇත්තේ පොලොන්නරුවේ .......................................... දේවාලයෙන් ය.

44. නැටුම්, ගැයුම්, වැයුම් සහිතව ගිරි භාණ්ඩ නම් පූජාවක් පවත්වන ලද්දේ .................................. රජු ය.

45. තූර්ය භාණ්ඩ නාමාවලියක් පිළිබඳ තොරතුරු සඳහන් ගම්පොල යුගයට අයත් සංදේශ කාව්‍ය වන්නේ ............................................

46. "විහාර දේවාලවල තේවාව සඳහා නියම වූ කුලවලින් පැමිණ කළගෙඩි සෙල්ලමේ යෙදෙන නළඟනෝ වෙති" යනුවෙන් .......................................... නම් දේශාටන වාර්තාකරු තමාගේ .......................................... නම් ග්‍රන්ථයේ සඳහන්කර ඇත.

47. නර්තන කලාව හා සම්බන්ධ තොරතුරු හමුවන කෝට්ටේ යුගයට අයත් සංදේශ කාව්‍ය 02ක් වන්නේ ........................................ හා ........................................

48. "මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත්" යනුවෙන් ........................................ නම් දේශාටන වාර්තාකරු සඳහන් කර ඇත.

49. 1934 වසරේදී ................................................ පඬිතුමාගේ ලංකා ගමනය නිසා ලක්දිව නර්තන කලාවේ ප්‍රබෝධයක් ඇති විය.

50. රජයේ පාසල්වල සෞන්දර්ය විෂය අනිවාර්ය විෂයක් බවට පත් කිරීම හා ගිරාගම ගුරු විදුහල ආරම්භ කිරීම .......................... වසරේ දී සිදු විය.

51. අ.පො.ස. සාමාන්‍ය පෙළ හා අ.පො.ස. උසස් පෙළ විෂය මාලාවට නර්තනය විෂය ඇතුළත් කරනු ලැබුවේ .......................... වසරේ දී ය.

52. කැලණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධ කර සෞන්දර්ය අධ්‍යාපන ආයතනය පිහිටුවන ලද්දේ ............................... වසරේ ය.

53. කැලණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධ ආයතනය වූ සෞන්දර්ය අධ්‍යාපන ආයතය ස්වාධීන විශ්ව විද්‍යාලයක් බවට පත්කරන ලද්දේ .............................. වසරේ ය.

54. කොළඹ යුගයේ නර්තන කලාව ප්‍රචලිත වීමට .......................................... සභාව හා .......................................... නැටුම් කණ්ඩායම ප්‍රබල ලෙස හේතු විය.

55. රජයේ ලලිත කලායතනය ...................... වසරේදීත් සංස්කෘතික දෙපාර්තමේන්තුව ......................... වසරේදීත් පිහිටවනු ලැබී ය.

56. උඩරට වන්නම් බිහිවූයේ මහනුවර රජකළ ........................................................ රජුගේ කාලයේ ............................................................... ගායනා විශේෂයක් ලෙස ය.

57. උඩරට වන්නම් රචනා කළ පුද්ගලයින් දෙදෙනෙකු වන්නේ ............................................................ බමුණා හා ............................................................ අධිකාරම් ය.

58. ජේ. ඊ. සේදරමන් මහතා රචනා කළ ............................................................ ග්‍රන්ථය තුළින් උඩරට වන්නම් රචනා වීම පිළිබඳ තොරතුරු ඇත.

59. ගණිතාලංකාර බමුණා රචනා කළ .......................................... ග්‍රන්ථය ඇසුරුකර මල්වතු විහාරවාසී හිමිනමක් උඩරට වන්නම් රචනා කළ බව කිරිඇල්ලේ ඥානවිමල හිමි කියයි.

60. අන්ධ අයෙකු තමාට පෙනීම ලබාදෙන ලෙස ඉල්ලා උපුල්වන් දෙවියන්ට පූජාවක් ලෙස පහතරට සින්දු වන්නම් ගායනා කළ බව ................................................ මහතාගේ ................................................ ග්‍රන්ථයේ ඇත.

61. ............................................................... නම් කාව්‍ය රචකයා විසින් පහතරට සින්දු වන්නම් රචනා කළ බව ද කියයි.

62. විනෝදාස්වාදය මුල් කරගනිමින් රචනාවූ බව සැලකෙන සබරගමු වන්නම් තුළ ඇති ඇතැම් වන්නම් ............................... ගී ස්වරූපය ගනී.

63. 1956 වසරේ දී ඩී. ඩී. යාහින්න මහතා විසින් රචිත ............................................................ ග්‍රන්ථය සහ 1958 වසරේ දී ඊ. ඒ. දෙල්ගොඩ මහතා විසින් රචිත ............................................................ ග්‍රන්ථය සබරගමු වන්නම් පිළිබඳ ලිඛිත මූලාශ්‍ර වේ.

64. "කොහොඹා යක් කංකාරිය හා සමාජය" ග්‍රන්ථය ............................................................ මහතා විසින් රචනා කර ඇත.

65. ජයසේන කෝට්ටගොඩ මහතා විසින් රචනා කරන ලද ............................................................ ග්‍රන්ථය පහතරට නර්තන සම්ප්‍රදාය පිළිබඳ රචනා වූවකි.

66. මුදියන්සෙ දිසානායක මහතා විසින් දේශීය නර්තන සම්ප්‍රදායන් පිළිබඳ විස්තර ඇතුළත් කර ............................................................. ග්‍රන්ථය රචනා කර ඇත.

67. "භාරතීය සම්භාව්‍ය නර්තන කලාව" ග්‍රන්ථය .............................................................. මහතා විසින් රචනා කර ඇත.

68. "ශාන්තිකර්ම සහ සිංහල සමාජය" ග්‍රන්ථය .............................................................. මහතා විසින් රචනා කර ඇත.

69. ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය විසින් සබරගමු නර්තන කලාව පිළිබඳ තොරතුරු ඇතුළත් කර රචනා කළ ග්‍රන්ථය වන්නේ ..............................................................

70. "රට යකුම හෙවත් රිද්දි යාගය" .............................................................. මහතාගේ ග්‍රන්ථයකි.

71. ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය විසින් සමන් දේවාලය පිළිබඳ තොරතුරු සඳහන් කර ............................................................. ග්‍රන්ථය ලියා ඇත.

72. සිංහරාජ වන්නමේ බෙර පදය ................................................ වන අතර ................................................ තිතට වාදනය කරනු ලබයි.

73. මාත්‍රා 2 + 4 දෙතිතට නර්තනය කරනු ලබන්නේ ................................................ වන්නම වන අතර ඒ සඳහා මූලික බෙර පදය ලෙස ................................................ පදය වාදනය කරයි.

74. මුෂලඩි වන්නම ................................................ දෙතිත හා ................................................ තනි තිත යන තාල රූප දෙකම මිශ්‍රව නිර්මාණය වී ඇත.

75. මාත්‍රා 2+2+4 තුන් තිතට අනුව ................................................ වට්ටම නර්තනය කරයි.

76. "දොං ජිංත ගත දොංත" වට්ටම ................................................ තාලයට නර්තනය කරයි.

77. තනි තිතේ කොටස් වන්නේ ................................................ , ................................................ , ................................................ ය.

78. දෙතිතේ ප්‍රබේධ වන්නේ ................................................ , ................................................ , ................................................ ය.

79. තුන් තිතේ ප්‍රබේධ ලෙස ................................................ තුන් තිත හා ................................................ තුන් තිත නම් කළ හැකි ය.

80. නන්දිකේෂ්වර විසින් රචනා කර ඇති ................................................ ග්‍රන්ථයේ සතර අභිනය පිළිබඳ සඳහන් වේ.

81. සිව් වැදෑරුම් අභිනය ................................................ , ................................................ , ................................................ , ................................................ ලෙස දැක්විය හැකි ය.

82. සිරුරේ කොටස් අතරින් අංග ලෙස හඳුන්වන්නේ ........................................................................................ ය.

83. ප්‍රත්‍යංග යනු ........................................................................................ වේ.

84. උපාංග ලෙස හඳුන් වන්නේ ........................................................................................ ය.

85. රස භාව සංකල්පය පිළිබඳව භරත මුණිගේ ................................................ ග්‍රන්ථයේ සඳහන් වන අතර එහි දක්වා ඇත්තේ රස ................... ක් පමණ ය.

86. රස නිෂ්පත්තිය සඳහා මුල් වන්නේ ...................................... භාවයකි.

87. ................................ භාවය තුළින් වීර රසයත් ................................ භාවයෙන් භයානක රසයත් උපදී.

88. අද්භූත රසය ................................ භාවයෙනුත් , කරුණා රසය ................................ භාවයෙනුත් , ශාන්ත රසය ................................ භාවයෙනුත් උපදී.

**ප්‍රස්තාරකරණයේ දී ක්‍රමවිධි අනුගමනය කිරීම.**

**තුන් තිතේ ප්‍රභේද දක්වමු**

මාත්‍රා 2 තනි තිත, මාත්‍රා 3 තනි තිත මාත්‍රා 4 තනි තිත (සුළු, මැදුම්, මහ) යන මූලික තිත් රූප ආශ්‍රයෙන් දේශීය තාල ශාස්ත්‍රයේ විවිධ තිත් රූප ගොඩනැඟී ඇත. තිත් රූප තුනක් එකතු වීමෙන් තුන් තිතේ තිත්රූප සෑදී ඇත. ඒ අනුව තුන් තිතේ ප්‍රචලිත තිත් ප්‍රභේද දෙකක් හඳුන්වා දිය හැකි ය.

තුන්තිතේ ප්‍රචලිත තිත් ප්‍රභේද

- දෙසුළු මැදුම් තුන්තිත (මාත්‍රා 2+2+3)
- දෙසුළු මහ තුන් තිත (මාත්‍රා 2+2+4)

තුන් තිතේ තාල ප්‍රභේද ප්‍රස්තාරකරණයේ දී භාවිත කරන සංකේත වන (^) තිත් යන තාල සංඥාව ද තෙයි (/) යන සංඥාව ද එකතු වීම නිසා තිත්, තිත් තෙයි යනුවෙන් භාවිත කෙරේ.

උදා :

| ^ | | ^ | | / | | |
|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 |

තුන් තිතේ තිත් ප්‍රභේදයේ දී ඉහත සඳහන් කර ඇති ආකාරයට අසාතය තැබීම සංකේතවත් කෙරේ.

උදා : තිත් තිත් තෙයි
^ ^ /

මාත්‍රා 2 + 2 + 3 (දෙසුළු මැදුම් තුන්තිත)

| | | | | | |
|---|---|---|---|---|---|
| ^1 2 | ^1 2 | /1 2 3 | ^1 2 | ^1 2 | /1 2 3 |
| දොම් තකු | දොම් තකු | දොම් ජිං - | ගත් - | තත් - | ජිං තරි කිට |

මාත්‍රා 2 + 2 + 4 (දෙසුළු මහ තුන්තිත)

| | | | | | |
|---|---|---|---|---|---|
| ^1 2 | ^1 2 | /1 2 3 4 | ^1 2 | ^1 2 | /1 2 3 4 |
| කු දි | ග ත | ග ත දොං - | කු දි | ග ත | ග ත දොං - |

පැවරුම :-
*1 සිංහ රාජ් වන්නම අදාළ තිත් රූපයට ප්‍රස්තාර කරන්න.
*2. රබන් කවි, බාමර කවි, ප්‍රස්තාර කරන්න.
3.* දොං ජිංත ගත දොංත බෙරපදය (2+3 ට)
* දොං දොංජිං ජිං ගජිගත – (2+4 ට)
* දෝං ජිං ජිං තකට දොංතත 3+4
ප්‍රස්තාර කරන්න.

# වට්ටම්

## උඩරට කුදංත ගත දොං වට්ටම (දෙසුළු මහ තුන් තිත 2+2+4)

| | ^ | | ^ | | / | | | | ^ | | ^ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| පිරිමේ පදය | + | + | + | + | කු | දං | - | ත | ග | ත | කු | ද | දො | මි | කි | ට |
| | ත්‍රි | ක්‍රිට | ක්‍රුත් | ද්‍රත් | තා | | | | | | | | | | | |
| 1 පදය | + | + | + | + | කු | දං | - | ත | ග | ත | දොං | - | කු | දං | - | ත |
| | ග | ත | දොං | - | | | | | | | | | | | | |
| කස්තිරම | + | + | + | + | තත් | - | ජිත් | - | තොං | - | නං | - | තා | - | | |
| අඩව්ව | + | + | + | + | තාම් | - | දො | - | මි | ති | ග | ත | දො | මි | කි | ට |
| | කඩ | තක | තරි | කිට | කි | ත | ක | දො | මි | ති | ග | ත | කිත් | - | තත් | - |
| | කු | ද | කු | ද | තා | - | කු | ජිත් | - | ත | ග | ත | දො | මි | කි | ට |
| | ත්‍රි | ක්‍රිට | කුන් | දත් | තා | - | | | | | | | | | | |
| 2 පදය | + | + | + | + | කුං | දං | - | ත | ග | ත | දොං | - | කු | දං | - | ත |
| | ග | ත | දොං | | | | | | | | | | | | | |
| කස්තිරම | + | + | + | + | තත් | - | ජිත් | - | ත | ක | ජිත් | - | තත් | - | ජිත් | - |
| | තොං | - | නං | | තා | - | | | | | | | | | | |
| අඩව්ව | + | + | + | + | තත් | - | තො | ග | ත | ක | තො | ග | තක් | කඩ | ත්‍රි | ක්‍රිට |
| | ත | ක | තො | ග | ත | ක | ට | ජි | ක | ට | තො | ග | ජිත් | කඩ | තරි | කිට |
| | ත | ක | තො | ග | තා | - | කු | ජිත් | - | ත | ග | ත | දො | මි | කි | ට |
| | තරි | කිට | කුන් | දත් | තා | - | | | | | | | | | | |